# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# දැන්වීමයි

**2020/ 2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවූ අවසන් දිනය, එනම් 2021 ජුනි මස 18 වැනි දින හෝ එදිනට පෙර අයදුම්පත් යොමු කිරීමට නොහැකි වූ සිසුන් වෙත කෙරෙන නිවේදනයයි**

2020 ඔක්තෝම්බර් මස පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 2020/ 2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීම 2021 ජුනි මස 18 වැනි දින අවසන් කරන ලදී. කෙසේ වෙතත් ඒ වන විට කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් රට තුළ පනවන ලද සංචරණ සීමා/ ඇඳිරිනීති තත්ත්වයන් හේතුවෙන් **2021 ජුනි මස 18 වැනි දින** හෝ එදිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම් කිරීමට නොහැකි වූ සිසුන් හට අයදුම්පත් යොමු කිරීමට **2021 ජූලි මස 26 වැනි දින සිට 2021 ජූලි මස 30 වැනි දින** දක්වා සඳහා කාල සීමාවක් ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

එම කාල සීමාව තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරන සිසුන් හට **2021 ජූලි මස 31 වැනි දින සිට 2021 අගෝස්තු මස 14 වැනි දින දක්වා** සති දෙකක (02) කාල සීමාවක් තුළ තමන් අයදුම් කළ අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා **"Uni-Codes"** අනුපිළිවෙළ අන්තර්ජාලය හරහා UGC ගිණුමට පිවිස එක් වරක් පමණක් වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙන බව තවදුරටත් කරුණාවෙන් දනුම් දෙමි.

**සභාපති**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**
**2021.07.22**